



# පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

## 5 තේමාව



# 5 ශ්‍රේණිය

# අප පරිහරණය කරන දේ








**ශ්‍රී රුවන් තිළිණ**

ශාස්ත්‍රවේදී, NCT සිවිල් ඉංජිනේරු,

රජයේ පාසල් ආචාර්ය 071 66 84 251

# 05. අප පරිහරණය කරන දේ

අපට එදිනෙදා ජීවිතයේ විවිධ භාණ්ඩ හා උපකරණ පරිහරණය කිරීමට අවශ්‍ය වේ. ඒවා පෞද්ගලික මෙන් ම පොදු වශයෙන් ද පරිහරණය කෙරේ. එසේ පරිහරණය කිරීමේ දී ඒවායේ පිරිසිදුකම, ක්‍රමවත් බව, නිසි අයුරින් පරිහරණය සහ පවත්වා ගැනීම පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් ය. එසේ පරිහරණය කිරීම පිළිබඳව මූලික හුරුව ලබා දීමට කටයුතු කිරීම මෙම තේමාවෙන් අපේක්ෂා කෙරේ. ඒ සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නිරත වෙමින් ඒ පිළිබඳව අත්දැකීම් ලබා ගැනීම අවශ්‍ය වේ.




### ❖ අප පෞද්ගලිකව පරිහරණය කරන දේ

- ★ දත් බුරුසුව
- ★ ඇඳ ඇතිරිලි
- ★ මේස්
- ★ සෙරෙප්පු, සපත්තු
- ★ මුහුණ පිස දමන තුවාය
- ★ පනාව
- ★ තොප්පිය
- ★ අත් ඔරලෝසුව
- ★ ජංගම දුරකථනය
- ★ කෝප්පය
- ★ පිඟාන
- ★ කොට්ටය
- ★ ඇඳුම්
- ★ ලේන්සුව






### ❖ අප පොදුවේ පරිහරණය කරන දේ

- ★ බිත්ති ඔරලෝසුව
- ★ පුටුව
- ★ ඉස්ත්‍රික්කය
- ★ රූපවාහිණිය
- ★ ශීතකරණය
- ★ විදුලි උදුන
- ★ හිරමනය
- ★ ස්ථාවර දුරකථනය
- ★ රෙදි සෝදන යන්ත්‍රය
- ★ බාල්දිය
- ★ පිහිය
- ★ මේසය
- ★ බාල්දිය
- ★ වළන්
- ★ ගුවන් විදුලිය
- ★ හිරමනය







## ✣ භාණ්ඩ හා උපකරණ පරිහරණයේ දී ඔබ විසින් පුරුදු විය යුතු යහපත් පුරුදු .....

* තමා අඳින පලඳින දෑ පිරිසිදු කර අල්මාරියක හෝ බෑගයක හෝ පිළිවෙළට අසුරා තැබීම.
* පාවහන්, සපත්තු රඳවනයක හෝ වෙනත් ස්ථානයක හෝ පිළිවෙළින් අසුරා තැබීම.
* පිඟන්, කෝප්ප තැබීම සඳහා පිඟන් රාක්කයක් හෝ බිත්ති රඳවනයක් භාවිත කර පිළිවෙළට තැබීම.
* තමන් පරිහරණය කරන පොත් පත්, පොත් රාක්කයක, පොත් අල්මාරියක හෝ පොත් මේසය මත හෝ පිළිවෙළට තැබීම .

*පෞද්ගලික ව භාවිතා කරනු ලබන භාණ්ඩ හා උපකරණ පොදුවේ භාවිතා කිරීම සෞඛ්‍යාරක්ෂිත නොවේ.*



## ✣ නිවසේ පොදුවේ භාණ්ඩ හා උපකරණ පරිහරණයේ දී ඔබ විසින් පුරුදු විය යුතු යහපත් පුරුදු .....

- පරිහරණය කරන භාණ්ඩ හා උපකරණ නිවස තුළ පිළිවෙළකට අසුරා තැබීමෙන් නිවසට අලංකාරයක් ලැබෙන අතර පිළිවෙළ නිසා වඩාත් පහසුවෙන් යමක් සොයා ගත හැකි වීමෙන් කාලය ඉතිරි වන බව.
- පිළිවෙළ හා පිරිසිදුකම ජීවිතයට එක් කර ගත් විට ප්‍රසන්න හැඟීමෙන් කටයුතු කළ හැකි බව
- සෑම විට ම තමා පරිහරණය කරන ලද භාණ්ඩ හා උපකරණ භාවිතයට ගත් පසු නිසි පරිදි නිසි තැන තැබීම, පිළිවෙළකට අසුරා තැබීම, පිරිසිදු කිරීම, නඩත්තු කිරීම කළ යුතු ය.

*අප පෞද්ගලිකවත්, පොදුවේත් පරිහරණය කරන භාණ්ඩ හා උපකරණ පිරිසිදුව තබා ගැනීම අපේ යුතුකමක්. එසේ නොවන අවස්ථාවල දී අපට නොයෙක් ලෙඩ රෝග ඇති වීමට ඉඩ තියෙනවා. ඒ විතරක් නෙමෙයි කොට්ට, පැදුරු ආදියත් අව්වට දමා වියළා ගත යුතුය.*





## ❖ නිවස තුළ අතීතයේ දී සහ වර්තමානයේ දී පරිහරණය කරන ලද භාණ්ඩ

| අතීතයේ පරිහරණය කරන ලද භාණ්ඩ | වර්තමානයේ පරිහරණය කරන භාණ්ඩ |
|---|---|
| වංගෙඩිය , මෝල් ගහ, කුරහන් ගල | ඇඹරුම් යන්ත්‍රය |
| මැටි මුට්ටිය | පිසින උඳුන |
| රෙදි සේදීම | රෙදි සෝදන යන්ත්‍රය |
| හුමාලයෙන් තැම්බීම | විදුලි උඳුන |
| කුප්පි ලාම්පුව, ලන්තෑරුම | විදුලි බල්බය |
| දුමේ දමා වේලා කල්තබා ගැනීම | ශීතකරණය |
| අතේ මසන ඉදිකට්ට ආධාරයෙන් රෙදි මැසීම | රෙදි මසන යන්ත්‍රය |

## ❖ නිවස තුළ වර්තමානයේ දී පරිහරණය කරනු ලබන ගෘහ භාණ්ඩවල වෙනස්කම් හේතුවෙන් ලැබෙන වාසි හා අවාසි

**වාසි**

- ගතවන කාලය අඩු වීම.
- වැයවන ශ්‍රමය අඩු වීම.
- එදිනෙදා කටයුතු පහසුවෙන් කර ගත හැකි වීම.
- පිරිසිදුව පිළිවෙළට සකසා ගත හැකි වීම.
- දවසේ වැඩ කටයුතු තමාට ගත හැකි වීම.

**අවාසි**

- ඉන්ධන හෝ විදුලි බලය වැය වීම.
- මිනිසා අඩුවෙන් තම ශ්‍රමය යෙදවීම නිසා රෝගී වීම.
- විශාල මුදලක් උපකරණ මිලදී ගැනීමට වැය වීම.
- උපකරණ පාවිච්චියේ දී ආරක්ෂා -කාරී නොවීමෙන් අනතුරු සිදු වීම.
- මයික්‍රොවේ උඳුන වැනි උපකරණ ඇතැම් රෝග සඳහා නුසුදුසු වීම.

✣ නිවස තුළ එක් එක් ස්ථානවල තිබෙන භාණ්ඩ හා උපකරණ හඳුනා ගනිමු.



මුළුතැන්ගෙය



සාලය



නිදන කාමරය



එදිනෙදා අප පරිහරණය කරන දේ හරිහැටි නඩත්තු නොකිරීමෙන් ඒවා ඉක්මනින් ම විනාශ වී යනවා. ඒ නිසා පහත ක්‍රම මගින් එම තත්ත්වය වළක්වා ගත හැකිය.

01. දිනපතා පිරිසිදු කිරීම
උදා :- පිඟාන, කෝප්ප, ලේන්සු

02. කැඩී බිඳී ඇත්නම් සකස් කිරීම.
උදා :- පුටු, මේස, රාක්ක

03. ඉරී ඇත්නම් මැසීම.
උදා :- තිර රෙදි, මේස රෙදි, ඇඳුම්, බෑග්

04. ගෙවී ඇත්නම් තෙල් දැමීම හෝ අමතර කොටස් දමා නැවත සකස් කිරීම.
උදා :- මෝටර්, කප්පි, මැෂින්, සපත්තු

### ✣ පාසලේ දී උපකරණ අනාරක්ෂිතව පරිහරණය කිරීමෙන් සිදුවිය හැකි අනතුරු

- ➜ බෝලය , හෙල්ල, කවපෙත්ත වැදී තුවාල වීම.
- ➜ පැන්සලවල තුඩ ඇනී තුවාල වීම.
- ➜ පුටුව පැද්දීම නිසා වැටී තුවාල වීම.

> පාසල සතු උපකරණ හා භාණ්ඩ පිළිබඳව සටහන් තබා ඇත්තේ ඉන්වෙන්ට්‍රි පොතේ ය.
> Inventory book

### ✣ පාසල තුළ ඉන්වෙන්ට්‍රි පොතක් පවත්වාගෙන යා යුත්තේ ඇයි ?

1. පාසලේ භාණ්ඩ ලැයිස්තු ගත කර තබා ගැනීමට
2. උපකරණ හා භාණ්ඩ කැඩී බිඳී ගියහොත්, අස්ථානගත වුවහොත් සටහන් තැබීම.
3. පරිපාලක අයගේ පාලනයේ දී, භාණ්ඩ පිළිබඳ දැන ගැනීම සඳහා

### ✣ පහත බලශක්තීන් සහ උපකරණ භාවිතයේ දී ඔබෙන් ඉටුවිය යුතු යුතුකම් හා වගකීම්

1. ජලය - විදුලි බල්බ , අනවශ්‍ය විදුලි බල්බ නිවා දැමීම.
2. හිරු එළිය - සූර්ය කෝෂ පාවිච්චියේ දී අනවශ්‍ය ලෙස විදුලිය නාස්ති නොකර වැඩිපුර ප්‍රමාණය ප්‍රධාන විදුලි පද්ධතියට යොමු කිරීම.
3. ගල් අඟුරු- විදුලි බල්බ, විදුලි උපකරණවල අනවශ්‍ය නාස්තිය ඉවත් කිරීම.
4. පෙට්‍රල්, ඩීසල්- අනවශ්‍ය ලෙස ඉන්ධන වාෂ්ප වීම වළක්වා දීම.
5. දර - දර ලිප් අනවශ්‍ය ලෙස පත්තු කර දර දවාලීම වැළැක්වීම.
6. ගෑස් - ගෑස් උඳුන ප්‍රවේශමෙන් පාවිච්චිය, නිතර උඳුන පිරිසිදු ව තබා ගැනීම , නිල් දැල්ල පාවිච්චියට ගැනීම.





අප ජීවත්වන කාලයේ අත්‍යවශ්‍ය ම දෙයකි ජලය.
ජලය අපට අවශ්‍යවන අවස්ථා බොහෝමයක් ඇත.
තවද,
ජලය ලබා ගන්නා මූලාශ්‍ර ද අප දන්නෙමු.

## ✣ ජලය පාවිච්චි කිරීමේ දී සැලකිය යුතු කරුණු මොනවා ද?

1. තමාගේ පරිභරණයට පමණක් ප්‍රමාණවත් අයුරින් ජලය පරිභරණය කිරීම.
2. ජල කරාමය ඇර දමා ජලය අපතේ යන අයුරින් කටයුතු නොකිරීම.
3. නිවසේ කැඩුණු ජල කරාම, ජල නළ අලුත්වැඩියා කිරීම
4. පාවිච්චිකරන ලද ජලය නැවත ප්‍රයෝජනවත් දෙයකට යොදා ගැනීම.
5. වැසි ජලය එක් රැස් කර ගැනීමට කටයුතු කිරීම.

## ✣ ජලය පාවිච්චි කිරීමේ දී සැලකිය යුතු කරුණු මොනවා ද?

1. එදිනෙදා පිරිසිදු  කිරීමේ කටයුතු අඩාළ වීම.
2. ගොවිතැන් කටයුතු අඩාල වීම.
3. බීමට වතුර හිඟ වීම.
4. ජල විදුලිය නිශ්පදනය කළ නොහැකි වීම.
5. සතුන් මිය යෑම නිසා පරිසර දූෂණය වීම.

- පාසල් යන සිසුන් යහපත් ශරීර සෞඛ්‍යයක් පවත්වා ගැනීම සඳහා තම බර ප්‍රමාණය අනුව දිනකට ජල ලීටර 1½ - 2 දක්වා ප්‍රමාණයක් පානය කළ යුතු ය. $\left[\frac{\text{ශරීර බර (කි.ග්‍රෑ.)}}{30}\right]$

අතීතයේ අපේ මුතුන් මිත්තන් වැසි ජලය එක් රැස්කර
වාරි කර්මාන්තය දියුණු කර කෘෂි කර්මාන්තය
නඟා සිටවූහ.

## ✣ එක් එක් රජවරු ඉදිකළ වැව්

1. මහසෙන් රජතුමා - මින්නේරිය වැව
2. මහා පරාක්‍රමබාහු රජතුමා - පරාක්‍රම සමුද්‍රය
3. දේවානම්පියතිස්ස රජතුමා - තිසා වැව
4. පණ්ඩුකාභය රජතුමා - බසවක්කුලම වැව ( අභය වැව )
5. වසභ රජතුමා - මහවිලච්චිය වැව
6. මහාසේන රජතුමා - හුරුළු වැව / මාගල්ල / මහ කනදරාව
7. ධාතුසේන රජතුමා - කලා වැව / යෝධ වැව
8. දෙවන අග්බෝ රජතුමා - ගිරිතලේ / කන්තලේ



❖ එදිනෙදා ජීවිතයේ අතවශ්‍යවන ද්‍රව්‍ය නම් කර ඒවායේ මිළ ගණන් ලියන්න.

| අනු අංකය | භාණ්ඩ වර්ගය | රුපියල් | ශත |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

❖ එකම භාණ්ඩය සඳහා විවිධ මිළ ගණන් පැවතීමට හේතු

1. ඒවායේ ප්‍රමාණයන් මත
2. ඒවායේ ගුණාත්මක බව මත
3. ඒවායේ වෙළඳ නාම අනුව
4. ඇසුරුම්වල විවිධ බර මත

❖ සුබෝපභෝගී වෙළඳසැලක භාවිතාකරනු ලබන නූතන වෙළඳපොළ උපායමාර්ග .............

1. තාක්ෂණික මිනුම් තරාදි භාවිතය
2. ක්‍රෙඩිට් කාඩ් , විසා කාඩ් , වව්චර් යොදා භාණ්ඩ මිළ දී ගැනීමට හැකි වීම.
3. පරිගණක යොදා බිල් සැකසීම හා බිල්පත් යන්ත්‍ර මගින් බිල්පත් ලබා දීම.



## ✣ භාණ්ඩයක් මිලදී ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු

ඔබ මිල දී ගත් භාණ්ඩවල පහත දේවල් දක්නට ලැබේ දැයි බලන්න.

1. කල් ඉකුත් වීමේ දිනය
2. නිෂ්පාදිත දිනය
3. අන්තර්ගත දේ
4. ප්‍රමිති සලකුණ (SLS / ISO)
5. මිල
6. පරිහරණය කරන ආකාරය

## ✣ වෙළඳපොළේ භාණ්ඩ විකුණා ගැනීම සඳහා නිෂ්පාදකයන්, වෙළඳපොළ හිමිකරුවන් යොදා ගන්නා උපක්‍රම

1. ගුවන් විදුලිය / රූපවාහිනිය / පුවත්පත් / අන්තර්ජාල / දැන්වීම් පත්‍රිකා හා ප්‍රචාරක රථ යොදා ප්‍රචාරක කටයුතු කිරීම.
2. විසිතුරු ඇසුරුම් යොදා ගැනීම.
3. ක්ෂණික ලාභ ලබා දීම.
4. සමහර භාණ්ඩ සඳහා නොමිලේ තවත් භාණ්ඩයක් ලබා දීම.

*ව්‍යාජ අනුකරණවලින් යුතු භාණ්ඩ හා සේවා විකුණනු ලබන බවට දැනුවත් වූ විට එය **පාරිභෝගික ආරක්ෂක අධිකාරිය** ට දැන්විය යුතුය.*

## ✣ පුංචි ඔබේ සෞඛ්‍ය සඳහා නොගැළපෙන ආහාර ද්‍රව්‍ය නම්

1. ක්ෂණික ආහාර වර්ග
2. වර්ණක හා පාට යෙදූ බීම වර්ග
3. ඇතැම් ඖෂධ වර්ග
4. විසිතුරු ඇසුරුම් යෙදූ දවටනවල එතූ පැණිරස කෑම වර්ග



❖ අපට සේවා සපයන ආයතන හා නිළධාරී

| සේවා ස්ථානය | සේවා සපයන නිලධාරී | සේවාලාභීහු |
|---|---|---|
| ග්‍රාම නිලධාරී කාර්යාලය | ග්‍රාම නිලධාරී මහතා | ගම්වැසියන් |
| පොලිසිය | පොලිස් නිලධාරීන් | ප්‍රදේශවාසීන් හා ආයතන |
| ප්‍රවාහන සේවා | පෞද්ගලික හා ලංගම ආයතන භාර නිලධාරීන් | මගීන් |
| රෝහල | ප්‍රධාන වෛද්‍යවරුන්, හෙදියන්,සුළු සේවකයින් ආරක්ෂක නිලධාරීන් | රෝගීන් |
| පාසල | විදුහල්පතිතුමා, ගුරුවරු හා සේවකයන් | සිසුන් සහ ප්‍රදේශවාසීන් |
| තැපැල් කාර්යාලය | තැපැල් ස්ථානාධිපති හා තැපැල්කරුවන් | ප්‍රදේශවාසීන් හා ආයතන |

අමතර තොරතුරු දැන ගැනීමට :-

Youtube එකේ. Sri ruwan thilina channel එකට ගිහින් සෙත්තුව video එක බලා අතීතයේ උපකරණ නරඹන්න තාර්මිත වැඩපොළත් නැරඹීමට යන්න.


